# සන්නසට ආසිරි

ගැදි පැදි චම්පු විවරණ තබා තුන් රස
ලෝ දාතුවම සනසන නුවන් පැන් ඉස
රුවන් ආරකට බැඳ සිහළ රන් කූස
සඳ හිරු අතර සැනහේ, යෙහෙන් සන්නස

ගිනි කඳු හිරුද මුළු ලොව අතර බල බිඳ
සාමය සදාකාලික කරන ජලකඳ
ලොව ඇති එකම රට ලෙස පතළ නල රද
සන්නස වැළඳ ගම් වත්සලිත පිළ හිඳ

කොතැනෙක ආ ගියද හෙළ කොලු කෙලි රෑන
නොවෙතිය දැඩි බලයකට වෙළෙව්ව දීන
නොතබා කිසි නැඹුරුවක් සන්නස පාන
එනමඟ ලෙව්ලැකිය සරසන්නට ඔන

බස රැස දෙස නිතර ඔබ මොබ දෙපස නොබා
දියුණුව වඩා කරදර කම්කටොලු හඹා
සන්නස බිහි කරන අත් හිත් සවිය ලබා
යහතින් දිනේවා මතු පා පෙරට තබා

කලාභූෂණ තංගල්ලේ
**ධර්ම ශ්‍රී ගුණදාස**
කළුතර

## සන්නස
**සෑම මාසයකම 15 වන දා නිකුත් වෙයි**





ලියා දන්වන වග යි

**සන්නස** බිහි වන්නේ මිනිසුන් කීපදෙනෙකුගේ අති මහත් කැපවීම නිසා ය. යමකු සන්නසේ සේවය අගයන්නේ නම් ඒ අගයන්නේ මේ කුඩා මිනිසුන්ගේ ශ්‍රමයයි.

පසුගිය දා පැවැත්වුණ සන්නස සාහිත්‍ය උළෙලේ දී වික්ටෝරියානු පාර්මේන්තුවේ යුරෝක් ඡන්ද කොට්ඨාශය නියෝජනය කරන ගරු මන්ත්‍රීනී ලිස් බීටි මහත්මිය සන්නස විසින් ශ්‍රී ලාංකික සමාජයට ඉටු කරනු ලබන සේවය අගැයීම අපේ සතුටට හේතු වන්නේ ඒ නිසා ය.



ඔස්ට්‍රේලියාවේ පමණක් නොව ලොව දසත විසිරුණ ඔබ අතට සන්නස පත් කරන්නට කිසිදු ප්‍රතිලාභයක් අපේක්ෂා නොකර ස්වෙච්ඡාවෙන් උර දෙන අපේ හිතවත්තු සහ හිතවතියෝ මේ සම්මානයේ හවුල්කාරයෝ කාරියෝ වෙති.

සන්නස බිහි කරන්නට මූලික වූ සාලිය ගලප්පත්ති අසෝක සුබසිංහ හා ආනන්ද බාලසූරිය සොයුරන් ද මේ අවස්ථාවේ සිහිපත් කළ යුතුවෙයි. අද දක්වා සන්නස සමඟ එක්ව සිටිනා අසෝක සුබසිංහ හා ශ්‍රීනාත් මද්දුමගේ සොයුරෝ ද තුෂාරි ප්‍රියංගිකා හා ශ්‍රියානි ජයවික්‍රම මද්දුමගේ සොයුරියෝ ද මා සමඟම සිටිමින් සන්නසේ බර කරට ගත්තෝ වෙති.




ඩී බී කුරුප්පු, වි ක ධර්මබන්ධු, ෂ්‍යාමොන් ජයසිංහ, ලක්ෂ්මන් කොඩිතුවක්කු, සිසිර දිසානායක, මේනකා ජයතිලක, සනත් පියසේන, ආචාර්ය විද්‍යානි මනතුංග, චන්දි මාපා, මහින්ද දිසානායක දිවුල්ගනේ, තුසිත් අබේනායක, ශ්‍රියා කුමාරසිංහ, දසුන් ගජමන්, පුණ්‍යා මුණසිංහ, ලසන්ත පෙතියාගොඩ, හැරිස් පරකන්දෙණිය, විජයසිරි තිලකුමාර, සුගන්ධි ගජමන්, ජගත් වෙත්තසිංහ, ප්‍රසන්න කුරුකුලරත්න, ඇතුලු සියලුම හිතවතුන් හිතවතියන් සන්නසේ අප හා අත්වැල් බැඳ සිටීම ශක්තියකි.

ඒ හැරුණු කොට සන්නස බෙදාහරින්නට වෙහෙසෙන කීර්ති පොතුවිල ආනන්ද සමරතුංග, කපිල හේමන්ත බාලගේ, අසෝක නිමලසිරි, චන්ද්‍රා ඊරියගම යන සහෘදයන් ද සිහිපත් කළ යුතුම ය. සන්නස පාඨකයන් අතට පත් කරන ශ්‍රී ලාංකික වෙළඳ සල් සහ විහාරස්ථාන ද අපේ මතකයට එයි.

අපි දිග ගමනක් යමින් සිටින්නෙමු. ඔබ සැම අපට ශක්තියකි. මේ සම්මානය ඔබටම ය.

ජගත් ජේ එදිරිසිංහ




සන්නස

**සංස්කරණය/Editor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය/Asst. Editors**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

**තාක්ෂණ සහය**
දසුන් ගජමන් Dasun Gajaman

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**වර්ණ සංයෝජනය**
ඉනෝකා දිසානායක

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318

**TAS**
Anura Seneviratne
03 6327 4259

**Sannasa**
22 Lorne Street
Lalor Vic 3075 Australia

**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.